# පුස්තකාල ප්‍රවෘත්ති

පටුන


* අවුරුදු 4000 ක් පැරණි පුස්තකාලයක් 1 – 3

* මණ්ඩලීය පුවත් – 4

* පොත් පුවත් :
  - පාසල් පුස්තකාලයාධිපතීන්ට අවශ්‍ය පොතක් 5 – 6
  - ඉන්දීය මහජන පුස්තකාල ප්‍රමිති – 7

* සේන් නදී තෙර ගල් කණ්ඩියේ පොත්කඩ 8 – 13

* '77 වර්ෂයේ පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙල:
  - මහජන හා පාසල් පුස්තකාල ලේඛනය 14 – 16

* මණ්ඩලීය පුවත් :
  - ශ්‍රී ලංකාවේ ජනගහණය අනුව මහජන පුස්තකාල – 17

* ග්‍රාමීය මහජන පුස්තකාල පුවත් – 18

* ජාතික මහා පුස්තකාලයේ මෑතිවරණ ප්‍රකාශන එකතුව – 20


---


5 වන කලාපය – අංක: 2    1977 අප්‍රේල්/ජුනි



ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

72. බෞද්ධාලෝක මාවත

කොළඹ 4.

9958

## අවුරුදු 4000 ක් පැරණි පුස්තකාලයක්

1964 - 1972 වර්ෂයන් තුළ රෝම විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යාඥයින් කණ්ඩායමක් විසින් උතුරු සිරියාවේ එබ්ලා නම් ප්‍රදේශයේ කරන ලද කැනීම්වල දී අවුරුදු 4000 ක් පැරණි පුස්තකාලයක් සොයා ගන්නා ලදි. ක්‍රි.පූ.2000 සිට ක්‍රි.පූ.1600 දක්වා බලවත් රාජ්‍යයක්ව පැවැති එබ්ලා, යුප්‍රටීස් - ටයිග්‍රිස් ගංගා නිම්නයේ පැවැති මෙසපොටේමියානු සභ්‍යත්වය හා සමකාලීන යැයි ඉතිහාසඥයෝ නිගමනය කොට ඇත.

පුරාවිද්‍යාඥයින් විසින් සොයා ගන්නා ලද මෙම පුස්තකාලය එබ්ලා හි රාජ්‍ය පුස්තකාලය ලෙස හඳුනා ගෙන තිබේ. මෙසපොටේමියානු පුස්තකාලයන් හි මෙන් මෙහි ද මැටි පුවරුවල ලියූ ලේඛන 16,000 ක් පමණ තැන්පත් කොට තිබුණි. මෙම ලේඛන ලියා තිබුණේ කෝණාකාර අක්ෂර වලිනි. රජ මාළිගයේ රාජ සභා ශාලාවේ කෙළවර ගබඩා දෙකක් පුස්තකාලය වශයෙන් පාවිච්චි කොට තිබිණි. මෙයින් එක් කුඩා කාමරයක ලේඛන 1000 ක් ද විශාල කාමරයක අවශේෂ ලේඛන 15,000 ද තැන්පත් කොට තිබිත. මෙම පුවරු ලේඛන තැන්පත් කිරීම සඳහා භාවිතා කරන ලද්දේ බිත්තිවලට හේත්තු කොට තිබූ ලී රාක්ක ය. මෙම රාක්ක දෙකෙළවර ලී පොලු යොදා නො සැලෙන සේ පොළොවට සවි කොට තිබුණේ ය.

සොයා ගෙන ඇති ලේඛනවලින් බහුතර සංඛ්‍යාවක සඳහන් වනුයේ එබ්ලා රජවරුන් විසින් පවත්වා ගෙන යන ලද අන්තර් ජාතික වෙළඳාම් පිළිබඳ විස්තර ය. විශේෂයෙන් රෙදි පිළි හා ලෝහ වෙළඳ ගිණුම් විස්තර එහි ඇතුළත් වී තිබේ. මේ හැර නැගෙනහිර පෙරදිග රටවල් සමග ක්‍රි.වර්ෂයට අවුරුදු 3000 කට පෙර පැවති වෙළඳ ගනුදෙනු ද ඓතිහාසික වශයෙන් භූගෝලීය විස්තර ද මෙම පුවරු ලිපිවල ඉතා පැහැදිලිව සඳහන් වී තිබේ. වෙළඳ භාණ්ඩ යැවූ නගර කීපයක් ගැන ම එහි විස්තර සඳහන් වේ. ඒ අනුව මධ්‍යධරණී වෙරළෙහි සිට නැගෙනහිර මෙසපොටේමියාව දක්වා ද, ඇනටෝලියාවේ සිට පලස්තීනය දක්වා වූ විශාල ප්‍රදේශයක් තුළ මෙම වෙළඳ කටයුතු පැතිරී තිබූ බව අනාවරණය වේ.

අවුරුදු 4000 ක් පැරණි පුස්තකාලයක් ...

තවද, සුමේරියානු වචන ඇතුළත් ග්‍රන්ථ රාශියක් ද ද්වි භාෂාමය ශබ්ද මාලාවක් හා සුමේරියානු වචන උච්චාරණය දැක්වෙන ලේඛන ද මෙම ලේඛන අතරින් සොයා ගෙන ඇත.

එවැනි විද්‍යාත්මක තොරතුරුවලට අමතර වශයෙන් එකල සිරියානු රාජ්‍යයේ පැවැති අධ්‍යාපන ක්‍රමය පිළිබඳ වැදගත් තොරතුරු රැසක්ම මෙම ලිපිවල සඳහන් වී තිබේ. අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණයෙන් රජයේ පාලනයට යටත්ව තිබූ බව මේ අනුව නිගමනය කිරීමට හැකි වී ඇත. මෙම අධ්‍යාපන ක්‍රමය මෙසපොටේමියානු අධ්‍යාපන ක්‍රමයට ඉතා සමාන වූ බව ද පෙනේ. අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වී ඇත්තේ රාජ්‍ය පාලක නිලධාරීන් පුහුණු කිරීම ය. පසු කලෙක රාජ්‍ය තන්ත්‍රයේ වැදගත් නිලතල දැරූ ඇතැම් නිලධාරීන් ගේ නම් පාසැල් ශිෂ්‍යයින් වශයෙන් ඔවුන් අභ්‍යාසයන් වශයෙන් ලියූ ඇතැම් ලේඛනයන් හි සඳහන් වී තිබේ.

රාජ්‍ය ලේඛන අතර, මෙම අභ්‍යාස ද සුරක්ෂිතව තැන්පත් කොට තිබිණ. රාජ්‍ය තන්ත්‍රික ලේඛන ද, පාලන තන්ත්‍රයට අදාළ ලේඛන ද, අධිකරණ ලේඛන ද මෙම පුස්තකාලයේ තැන්පත්ව තිබූ වෙනත් ලේඛන වර්ගයන් ය. රජයේ අයවැය සම්බන්ධ ඇතැම් ලේඛනවලින් රජයේ ඇමති මණ්ඩලයේ අභ්‍යන්තර සංවිධානය පිළිබඳ තොරතුරු ද, ප්‍රාදේශීය පාලන ක්‍රමය හා සංවිධානය පිළිබඳ තොරතුරු ද, රජයේ සැකැස්ම පිළිබඳ ඉඟියක් ද, අයබදු ක්‍රමය පිළිබඳ විස්තර ද අනාවරණය වේ. ඊබ්ලා නගරයේ ජනගහනය, "උරුමය" හා සටන් කිරීමෙන් පැහැර ගත් ධනය ආදිය පිළිබඳ පරිපාලන හා අධිකරණ ගැටළු ද යනාදී වැදගත් තොරතුරු රාශියක් ද ලේඛනගත වී තිබේ.

රාජ්‍යතාන්ත්‍රික ලේඛන අතර ජාත්‍යන්තර සම්මුතීන් තුනක් හමුවී තිබේ. මෙයින් එකක් වන ඊබ්ලා - අසූරි සම්මුතිය එහි සඳහන් විශාල කොන්දේසි සංඛ්‍යාව හා දෙරට අතර පැවති දේශපාලන සම්බන්ධකම් ගැන සපයන තොරතුරු නිසා වැදගත් තැනක් ගනී.

සාහිත්‍ය ග්‍රන්ථ වශයෙන් සැලකෙන ඉතා වැදගත් ලේඛන රාශියක් ද මෙම පුස්තකාලයේ තැන්පත් වී ඇත. මෙයින් මෙසපොටේමියානු වෘත්තාන්තයක් වන ගිල්ගමේෂ් ඊබ්ලා පරිවර්තනයක් ගැන විශේෂයෙන් සඳහන් කළ යුතු ය. පුරා වෘත්ත වලට අනුව මෙම ඇසිරියානු වීරයා ගේ නම උරුක් ය.

අවුරුදු 4000 ක් පැරණි පුස්තකාලයක් ...

ඒබ්ලා පුස්තකාලයෙහි තිබී සොයා ගත් වෙනත් සාහිත්‍ය ග්‍රන්ථ අතර දේව කථා, දේව ස්තෝත්‍ර, යන්ත්‍ර මන්ත්‍ර රාශියක් ද වේ. මේ ග්‍රන්ථ සුමේරියානු කෘතිවලින් පරිවර්තනය කරනු ලැබී යැයි අනුමාන කරනු ලැබේ. මෙම කෘතිවල මුල් සුමේරියානු ග්‍රන්ථ හමු වී ඇතත් ඒවා සුමේරියානු භාෂා කථා ව්‍යවහාරයේ තොමු අවධියක් වූ ක්‍රි.පූ. 1800 ට පමණ කාලයට අයත් පිටපත් ය.

ඒබ්ලා රාජ්‍ය පුස්තකාලය සොයා ගැනීම සිරියා ඉතිහාසයේ ඉතා වැදගත් කාල පරිච්ඡේදයක ඉතිහාසය සොයා ගැනීමක් ලෙස සැලකේ. සිරියානු ඉතිහාසය මෙසපොටේමියාව හා ඊජිප්තුව වැනි ඉපැරණි රාජ්‍යයන් ගේ ඉතිහාසය හා සම තැන්හි තබා සැලකීමට උපකාරි වී ඇත්තේ මෙම පුස්තකාලයෙන් අනාවරණය වූ ඓතිහාසික තොරතුරු බව අවධාරණයෙන් සඳහන් කළ යුතු ය.

- එච්. අමරසිංහ -

---

" පොත් ඉතා හොඳ යාළුවෝය, ඇතැම් පොත් සතුටු සාමීචි කථාවෙන් සන්තෝෂ වන දොඩමළු මිතුරන් වැන්න, සමහර පොත් දළඅඩු පණ්ඩිතයන් වැන්න. සමහර පොත් ලජ්ජාවෙන් හැකිළෙන ගතානුගතික සුන්දර ගැනුන් වැන්න. සමහර පොත් පිපුණු හදවත් ඇති අකපට සුන්දර ගැනුන් වැන්න... "

- මාර්ටින් වික්‍රමසිංහ

(උපන්දා සිට : 271-272 පිටු)

---

පුස්තකාල මණ්ඩල බදු සහන ක්‍රමයෙන්
රු. 47,600/= ක පුස්තකාල අරමුදල් එකතුවක්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ආනපතියන් වෙත සලසන්නට යෙදී ඇත්තාවූ බදු සහන ක්‍රමය යටතේ, නොබෝදා විවෘත කරන්නට යෙදුනාවූ දෙහිවල-ගල්කිස්ස නව මධ්‍ය පුස්තකාලය සඳහා රුපියල් හතලිස් හත්දහස් හයසියයක මුදලක් එක්රැස් කර ගැනීමට හැකියාව ලැබී ඇත්තේය.

මුදල් අමාත්‍යවරයා විසින් 1963 අංක: 4 දරණ දේශීය ආදායම් පනතේ 16(ඈ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යා යතනයක් බවට ප්‍රකාශයට පත්කර ඇත. මෙවැනි පිළිගත් පුණ්‍යායතනයක අභිවෘද්ධිය හා කටයුතු පිණිස සිය ධනයෙන් හෝ සිය දේපලවලින් යම් පරිත්‍යාගයක් කරන තැනැත්තකුට දේශීය ආදායම් බදු සහන පනත යටතේ බදු සහන සැලසේ. මෙසේ කෙනෙකුගේ ජීවිත කාලය තුළදී පරිත්‍යාග කළ හැකි උපරිම ධන ප්‍රමාණය රු.3,00,000/= කි.

1970 අංක 17 දරණ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනතේ 14 වන වගන්තිය ප්‍රකාර පැවරී ඇති කටයුතු අතරින් කැමති කටයුත්තක් සඳහා මෙම ආධාර යෙදවිය හැකිය.

---

කටාන නව පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ
උළෙලට මණ්ඩලයෙන් පොත් තිළිණයක්

කටාන ගම්සභාවේ නව මහජන පුස්තකාල ගොඩනැගිල්ල පසුගිය මැයි මස 6 වන දින ජ්‍යෙෂ්ඨ පළාත් පාලන ඇමති ඇල්.බී.ජයසේන මහතා අතින් විවෘත කරන ලදී.

1977 මහජන පුස්තකාල සංවර්ධන වැඩපිළිවෙල යටතේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් සංවර්ධනය කිරීම සඳහාද මෙම පුස්තකාලය තෝරාගෙන ඇත්තේය.

මෙහිදී පැවති උත්සව සභාවේදී මණ්ඩලීය සංවර්ධන වැඩපිළිවෙල යටතේ එම පුස්තකාලයට ප්‍රදානය කිරීමට නියමිත රුපියල් දහස ක් වටිනා පොත් හා උපකරණ කට්ටලයෙන් කොටසක් සංකේත ප්‍රදානයක් වශයෙන් ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එච්.අමරසිංහ මහතා විසින් ප්‍රදානය කරන්නට යෙදුනි.

පුස්තකාලය විවෘත කිරීමේ උත්සව සභාව අමතා කතා කළ ගිහි පැවිදි ප්‍රභූන් සෑමොම පාහේ මහජන පුස්තකාල කුමක් සඳහාද යන්නත්, ඒවා නිසි පරිදි පරිහරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ වත් විශේෂයෙන් කරුණු සඳහන් කරන්නට යෙදුණාහ.

## පාසල් පුස්තකාලයාධිපතීන්ට අවශ්‍ය පොතක්!

පාසල් පුස්තකාල අත්පොත. ඩී.ඩී.විජේගුණසිංහ විසිනි.
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රකාශනයකි. 1976. පිටු 44.

පාසල් පුස්තකාල ක්‍රමවත්ව සංවිධානය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පසුගිය වසර කීපය තුළ ව්‍යාප්ත වැඩ පිළිවෙළක් ආරම්භ කරන ලදී. සෑම පාසලකම පුස්තකාලයක් පිහිටුවීම අමාත්‍යාංශයේ අරමුණ යි. මේ අනුව, පාසල් පුස්තකාල භාර පුස්තකාලයාධිපතීන් පත් කිරීමට පියවර ගෙන ඇති අතර, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සහාය ඇතිව ඔවුන් පුහුණු කරවීම ද කලක සිට පැවත එන වැඩ පිළිවෙළකි.

බොහෝ පුස්තකාලයාධිපතිවරුනට පුස්තකාල පරිපාලනය හා සංවිධාන ගැන අවශ්‍ය පුහුණුවක් ලබා ගැනීමේ දුෂ්කරතා ඇත. මේ නිසා පාසල් පුස්තකාල පවත්වා ගෙන යෑමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය හා පුස්තකාල සේවය පිළිබඳ සෑහෙන දැනුමක් ලබා ගැනීමේ මාර්ගයන් ඇත්තේ ඉතා මඳ වශයෙනි. මෙම අඩුපාඩුව බොහෝ දුරට මග හරවා ගැනීමට උපකාරී වන ග්‍රන්ථයක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළ කොට තිබේ. ඩී.ඩී.විජේගුණසිංහ මහතා ගේ පාසැල් පුස්තකාල අත්පොත එම ග්‍රන්ථය යි.

පාසල් පුස්තකාල සංවිධානය පිළිබඳ අපරදිග භාෂාවලින් රචිත පොතපත බොහෝ ඇතත්, ලංකාවේ පුස්තකාලවල ප්‍රයෝජනයට සුදුසු [illegible] පොතක් ඒ අතර නො මැතිය. බටහිර රටවල පාසල් පුස්තකාල බොහෝ දුරට සංවර්ධනය වී ඇති හෙයින් ද, එම පාසල් සංවිධානය අප රට පාසල් සංවිධානයට වඩා බෙහෙවින් වෙනස් හෙයින් ද, යට කී පොතපත අප රටවල පාසල් පුස්තකාල සංවිධානයට ප්‍රයෝජනයට ගැනීම එතරම් යෝග්‍ය නොවේ.

මෙම අඩුපාඩුව විජේගුණසිංහ මහතා ගේ පාසල් පුස්තකාල අත්පොතින් මග හැරී යා යුතු ය.

පාසල් පුස්තකාලයාධිපතිවරයකු විසින් අවශ්‍යයෙන් ම දත යුතු මූලික කරුණු මෙම ග්‍රන්ථයෙහි ඉතා පැහැදිලිව හා සරලව දක්වා තිබේ. එමෙන් ම ඉතා දියුණු වූ පුස්තකාලවල අනුගමනය කෙරෙන සංවිධාන ක්‍රම අප පුස්තකාලවල අනුගමනය කිරීමට නො හැකි වන්නේ ඇයි යන්නත්, ඒ වෙනුවට යොදා ගත හැකි ක්‍රමත් ඔහු පෙන්වා දෙයි. විශේෂ පුස්තකාල ගොඩනැගිල්ලක් නොමැති විට, පන්ති කාමරයක් ඒ සඳහා පිළියෙළ කර ගැනීම, මුද්‍රිත පරිග්‍රහණ ලේඛනයක් වෙනුවට සී.ආර්. රෙජිස්ටරයක් පාවිච්චි කිරීම, පොත්පත් තෝරා ගැනීම සඳහා ජාතික ග්‍රන්ථ නාමාවලි පමණක් ම අනුගමනය කිරීමට බලා නො සිට, වෙනත් මාර්ගවලින් අලුත් පොතපත පිළිබඳ තොරතුරු ලබා ගන්නා පිළිවෙළ දැක්වීම, සරල වර්ග කිරීමේ ක්‍රමයක් භාවිතා කිරීම, ශිෂ්‍යයන්ට සුදුසු පහසුවෙන් සකස් කර ගත හැකි පාඨක බලපත්‍රයක් හඳුන්වා දීම ඔහු විසින් සාර්ථක අයුරින් විස්තර කරයි. පුස්තකාලයකට අවම වශයෙන් අවශ්‍ය භාණ්ඩ හා උපකරණ මොනවා ද යන්නත්, ඒවායේ ප්‍රමාණය හා ස්වභාවය රූප සහිතව මනාව විස්තර කොට තිබේ, පළපුරුද්දක් නොමැති පුස්තකාලයාධිපතිවරුනට මෙම භාණ්ඩ හා උපකරණ සාදවා ගැනීමේ දී මුහුණ පෑමට සිදු වන ප්‍රශ්න බොහෝ සෙයින් මෙයින් මග හැරේ.

**පාසල් පුස්තකාලයාධිපතීන්ට අත් පොතක්...**

පුස්තකාල විද්‍යාවට සාමාන්‍යයෙන් ඇතුළත් නොවන, එසේ නැතහොත් පාඨමාලාවල දී සාමාන්‍යයෙන් නො සලකා හරින, එහෙත් වැදගත් කරුණු කීපයක් විජේගුණසිංහ මහතා තම ග්‍රන්ථයෙහි සඳහන් කරයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ පාලන නීතිරීති හා සම්ප්‍රදායයන් ද, ඊට අනුකූලව පුස්තකාලයාධිපතිවරුන් කටයුතු කළයුතු ආකාරය ද ඉන් එකකි. ඇතැම් පුස්තකාලවල ශ්‍රේණි කිහිපයකට අයත් පුස්තකාලයාධිපතිවරුන් පත් කර සිටීම නිසා පැන නැඟී ඇති වගකීම් පිළිබඳ ප්‍රශ්නය තවෙකකි. අදාළ චක්‍රලේඛ හා ක්‍රියාපටිපාටිය කෙරෙහි ඔහු අවශ්‍ය තැන්හි දී පුස්තකාලයාධිපතීන් ගේ අවධාරණය යොමු කොට තිබේ. පුස්තකාල සේවක සේවිකාවන් ගේ කාර්යයන් පද්ධතිය, විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. වෘත්තීය වශයෙන් පුස්තකාලයාධිපතිවරයකු ගේ වගකීම්වලට අමතර වශයෙන් එදිනෙදා කළයුතු කටයුතු වශයෙන් මෙම ක්‍රියාවලිය සෑම පාසැල් පුස්තකාලයාධිපතිවරයකුගේ ම අවධානයට ලක් විය යුතු ය.

පුස්තකාලයාධිපතීන් ගේ කාර්යයන් සහ ගුණාංග නමැති පරිච්ඡේදයේ කර්තෘ පුස්තකාලයාධිපතිවරයකු ගේ වෘත්තීය යුතුකම් ගැන මනා විවරණයක් කරයි. අර්ථවත් සේවාවක් ඉටු කිරීම සඳහා මෙම යුතුකම් පාසල් පුස්තකාලයාධිපතිවරුන් විසින් තරයේ ම සිතට ගැනීම අවශ්‍ය ය.

මෙම කුඩා ග්‍රන්ථය සියලුම පාසල් පුස්තකාලවලට සැපයීමට කටයුතු කිරීම නිර්දේශ කළ යුතු ය. පාසල් පුස්තකාලයාධිපතිවරයකු ට අවශ්‍ය මූලික දැනුම එයින් සැපයේ. මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමෙන් විජේගුණසිංහ මහතා පාසල් පුස්තකාල සංවිධාන යේ ඉතා වැදගත් කාර්යයක් ඉටු කළ බව සඳහන් කළ යුතු ය.

- එච්.අමරසිංහ -

---

**"A good book is the precious life-blood**
**of a master spirit, embalmed and treasured**
**up on purpose to a life beyond life."**

---

## මහජන පුස්තකාල ප්‍රමිති

(ප්‍රකාශනය : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය. මිළ රු:4.00 යි.)

මහජන පුස්තකාලයකින් බලාපොරොත්තු වන සේවය යථා පරිදි ඉටු කිරීම සඳහා එම පුස්තකාලයේ අවම වශයෙන් යම්කිසි පොත් සංඛ්‍යාවක් තිබිය යුතු ය. එමෙන් ම වාර සඟරා හා ප්‍රවෘත්ති පත්‍ර ද වෙනත් මාධ්‍යයන්ගෙන් ප්‍රකාශයට පත් වෙන පාඨකයින් ට ප්‍රයෝජනවත් වන තොරතුරු ද ලබා ගැනීමට පහසුකම් සැලැස් විය යුතු ය.

පොත්පත් හා ප්‍රවෘත්ති පත්‍ර ද වෙනත් පාඨක ද්‍රව්‍යය ද එක් රැස් කළ පමණින් පුස්තකාල සේවයක් ඇති නොවේ. එම පොත්පත් සේවය සමාජයට උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වන පරිදි සංවිධානය කළ යුතු ය. එසේ සංවිධානය කිරීමේ දී පාඨක අවශ්‍යතා අනුව පොත පත වර්ග කිරීම හා වෙනත් විස්තර සැපයීමෙන් පමණක් ද එම උපරිම ප්‍රයෝජනය නො ලැබේ. පාඨක සේවාවලට පුස්තකාල සූචිය උපකරණයක් පමණකි. මහජනයා උපකරණයක් භාවිතා නො කරම පුස්තකාල භාවිතා කිරීමට වඩා රුචියක් දක්වති. එම රුචිය වර්ධනය කිරීම පුස්තකාලයාධිපතීන් ගේ යුතුකම මෙන්ම වගකීම ද වේ. අවශ්‍ය තරම් පොත්පත් ලබා ගැනීම, දළ වශයෙන් පාඨක සංඛ්‍යාව අනුව කොතරම් සංඛ්‍යාවක් පොතපත අවශ්‍ය ද, ඒ පොතපත සියළුම දෙනාට ලැබීමට සලස්වන්නේ කෙසේ ද, කොතරම් සේවක සංඛ්‍යාවක් අවශ්‍ය ද, ඔවුන් ගේ සේවා ක්ෂෙත්‍ර නිගමනය කළ යුත්තේ කෙසේ ද, මෙම සේවා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා කිනම් උපකරණ භාවිතා කළ යුතු ද, පුස්තකාල ගොඩනැගිලි සැලසුම් කර ගත යුත්තේ කෙසේ ද, පුස්තකාල පිහිටවිය යුත්තේ කෙවැනි ස්ථානයන් හි ද, පුස්තකාලයක සේවා කෙතරම් දුරට ව්‍යාප්ත කළ හැකි ද, වැඩි වන ජනගහනය අනුව සේවාවන් දියුණු කළ හැක්කේ කෙසේ ද යනාදි ප්‍රශ්නවලට ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පිළිතුරු මෙම ග්‍රන්ථයෙන් සැපයේ.

මෙම ග්‍රන්ථයෙහි දක්වා ඇති ප්‍රමිති මට්ටමට තවමත් බොහෝ රටවල පුස්තකාල දියුණු වී නැතත් පුස්තකාලයාධිපතිවරුන් ගේ ඉලක්කය මෙම ප්‍රමිති මත පිහිටුවා ගතහොත් ක්‍රමයෙන් පුස්තකාල සේවාවන් වර්ධනය වී අවසානයේ දී බලාපොරොත්තු වන උපරිම සේවය ලබා දීමට හැකි වන්නේ ය.

ලංකාවේ පසු ගිය අවුරුදු කීපය තුළ මහජන පුස්තකාලවල ශීඝ්‍ර දියුණුවක් දකින්නට ඇත. එමෙන් ම අලුතින් පුස්තකාල පිහිටුවීම ද රජයේ අරමුණ වී ඇති මෙවැනි අවධියක පුස්තකාල පිළිබඳ ප්‍රමිති මාලාවක් නිකුත් වීම ඉතාම කාලෝචිත ය. ආරම්භයේ දී ම මෙවැනි මග පෙන්වීමකට අනුකූලව පුස්තකාල සංවිධානය කර ගැනීමෙන් අනාගතයේ දී ඇති විය හැකි අනේක ප්‍රශ්න මඟ හරවා ගැනීමට පුළුවන. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් "මහජන පුස්තකාල ප්‍රමිති" ප්‍රසිද්ධ කිරීමෙන්, මහජන පුස්තකාල සේවය ක්‍රමවත් මාර්ගයට යොමු කිරීම සඳහා ගත් තීරණය ප්‍රශංසනීය ය. මෙම ග්‍රන්ථය සියළුම මහජන පුස්තකාලයාධිපතිවරුන් ගේ හා පුස්තකාල අධිකාරීන් ගේ අවධානයට යොමු විය යුත්තකි.

"මහජන පුස්තකාල ප්‍රමිති" ජාත්‍යන්තර පුස්තකාල සංගම් සංවිධානයෙන් සකස් කොට ප්‍රසිද්ධ කරන ලද " STANDARDS FOR PUBLIC LIBRARIES " නමැති කෘතියේ සිංහල සංස්කරණය යි. ලෝකයේ විවිධ භාෂාවනට පරිවර්තනය වී ඇති මෙම ප්‍රමිති මාලාව ජාතික ප්‍රමිති වශයෙන් එම රටවල පිළිගනු ලැබ ඇත.

- පියවි -

**සේත් තඹි තෙර ගල් කණ්ඩියේ පොත් කඩ**

**මාර්ටින් වික්‍රමසිංහ විසිනි.**

අභාවප්‍රාප්ත මාර්ටින් වික්‍රමසිංහ මහතාණන් ගේ 86 වන ජන්ම දිනය පසු ගිය මැයි මස 29 වන දිනට යෙදිණි. ඒ මහතා විසින් ලියන ලද මෙම ලිපිය මුලින්ම ඉංගිරිසි පුවත්පතක පළ වූවකි.

වික්‍රමසිංහ මහතා ජීවතුන් අතර සිටියදී ම පරිවර්තකයන් විසින් මෙම ලිපිය සිංහලය ට නගන ලදි. සිංහල පරිවර්තනය වික්‍රමසිංහ මහතා ගේ අත් අකුරින්ම නිවැරදි කර දුන් අත් පිටපත පරිවර්තකයන් විසින් සුරක්ෂිතව තබා ගෙන ඇත්තේ ය.

ශ්‍රී ලංකාවේ ද මෙවැනි පොත් කඩ කොළඹ නගරයෙහි බහුලව දක්නට හැකි ය. මෙම පොත් කඩ හිමියන් ඉංගිරිසි අකුරු හැඳිනීම හැර කියවීමට තරම් ඥානයක් නොමැති වුව, ~~ලේඛකයා ගේ හෝ පොතේ~~ නම කී පමණින් එම කෘතිය තම පොත් කඩයෙහි ඇත් ද - නැත් ද යන්න කීමට තරම් ප්‍රවීණත්වයක් පොතපත හා ගැවසීමෙන් ම ලබා ඇති බව සඳහන් කිරීම වටනේ ය. එහි අගය කළ යුතු එක් අංගයක් නම්, හෙළුදු පොතපත මිළ කරන ආකාරය යි! "ජනප්‍රිය" පොත් ගැන මෙතරම් සැලකිල්ලක් නො දැක්වේ; පාඨකයා ගේ ස්වරූපය අනුව, පොතේ අගය ද අඩු - වැඩි කිරීම ඔහු ගේ තවත් ගුණයකි!

— සංස්කාරක

ඉදිරි පිටුවට.....

# සේන් නදී තෙර ගල් කණ්ඩියේ පොත් කඩ.

පසුගිය ජනවාරියේ (1968) මම සති දෙකක් පැරිසියේ ගත කළෙමි. වර්ෂාව නිසාත්, කුලී රථවල ගමන් කිරීමට අධික වියදම් දැරිය යුතු නිසාත්, පැරිසියේ සමහර දේ දැක බලා ගැනීමට නො හැකි වීම ගැන මගේ සිතේ ඇති වන්නේ ශෝකයකි. එනමුත්, කුලී රථ රියැදුරන් ගේ හා ජනියා චීන බොජුන් හල් හිමියන් ගේ සූරා කෑමට අප හසුවුවද, නව ප්‍රංශ ජීවිතය පිළිබඳ සුළුවෙන් හෝ අපක්ෂපාත සියුම් අවබෝධයක් ඇති කර ගැනීමට හියුගෝ, බැල්සක්, ෆ්ලෝබෑ, කැමූ ආදීන් සිට - සාත්‍රෙ, මොරියැක්, ලා ක්ලැසියෝ, ආර්මන්ඩ් ලැනෝ, ජීන් ජැනේ - (ෂීන් ෂොන්) ආදීන් ගේ ප්‍රංශ නව කතාවල ඉංගිරිසි අනුවාද කියැවීමෙන්, ප්‍රංශ ගැහැනුන් ගේ හා පිරිමින් ගේ චරිත හා ඔවුන් ගේ සංස්කෘතිය පිළිබඳව මා ලබා - වගා කර ගත් පළල් දැනුම මට බෙහෙවින් උපකාරී විය.

ශිෂ්ටාචාරය පිළිබඳ ස්වකීය මත - මතාන්තර, හැඟීම් හා විග්‍රහයන් යොදා ගනිමින් ක්ලයිව් බෙල් නම් විචාරකයා, "බටහිර ජාතීන් අතුරෙන් සභ්‍ය යැයි සැළකිය හැක්කේ ග්‍රීකයන්, ඉතාලි ජාතිකයන් හා ප්‍රංශ ජාතිකයින් පමණක් යැ" යි නිගමනයකට එළඹෙයි. ශිෂ්ටාචාරය - (සභ්‍යත්වය) පිළිබඳ තමාගේ ම හිතුවක්කාර වුවත් බුද්ධිගොචර වූ ඒ මතය නිසා, ඔහු එළඹී යට කී නිගමනය, නිස්සාර විකාරයකැ යි බැහැර කළ නො හැකි ය.

<u>ශිෂ්ටාචාරය ( CIVILIZATION )</u> නම් ස්වකීය ග්‍රන්ථයේ 'ශිෂ්ටාචාරය' අරබයා ක්ලයිව් බෙල් දී ඇති අර්ථ නිරූපණයේ අංග ගණනාවක් ම ප්‍රංශ ජනතාව අතර හා ඔවුන් ගේ සංස්කෘතියෙහි අද ද දක්නට ලැබේ.

ශිෂ්ටත්වය හා ම්ලේච්ඡත්වය පිළිබඳව ඔහු දක්වන විවරණය පරිච්ඡේද තුන-හතරකට දිවෙ යි. ඔහු එළඹි නිගමනයන් අතුරෙන්, අතරින්-පතරින් තෝරා ගත් අදහස් කිහිපයක් මම මෙහි දක්වමි;

> ලාභය තකා හෝ මෝඩ ඇදහිලි නිසා හෝ නොව, සිතා-මතා සෞන්දර්යය උදෙසා සැප පහසුකම් කැප කරන ජනයා තුළ අධ්‍යාත්මික 'හරයන්' පිළිබඳ හැඟීමක් ඇතැ යි මම විශ්වාස කරමි. වස්තු සැපයීම් සඳහා ඉගැන්වෙන කාර්මික අධ්‍යාපනයකට වඩා, ජීවත් වීම ගැන ඉගැන්වෙන නිදහස් අධ්‍යාපනයක් තෝරා ගැනීම, උසස් ශිෂ්ට බුද්ධියක් විදහා පාන, එය හෙළි කරන තවත් ලක්ෂණය කි.
>
> සභ්‍යත්වයෙන් උසස් අවධියකදී, කලාකරුවා සම්ප්‍රදාය නොහොත් පරම්පරා දහම කෙරෙහි එරෙහි නො වන්නාක් මෙන් ම, එය ගැන සැක ඇති නො කරන අතර ම, ඉන් ලබා ගත හැකි යමක් ඇත්නම්, එය නිදහස් ලෙස උකහා ගැනීමට උත්සාහ ගනී.

නිදහස් අධ්‍යාපනය, ජීවිතය භුක්ති විඳීමට අපට
උගන්වයි. අපට හෝ අන් අයට භුක්ති විඳීමට
උපකාර විය හැකි දේවල් ලබා ගැනීමට ප්‍රායෝගික
අධ්‍යාපනය අපට උගන්ව යි.

චතචාරියකුගෙන් ශිෂ්ට මනුෂ්‍යයකු පැහැදිළිව හඳුනා
ගත හැකි ගති-ගුණයක් නම්, සිනා-උපහාස රස
පිළිබඳ හැඟීම යි. ඒ හැඟීම අවසාන වරටත්
විග්‍රහ කිරීමේ දී හෙළි වන්නේ එය අනිකක් නොව,
වර්ධනය වූ අධ්‍යාත්මික භරය පිළිබඳ හැඟීම බව යි.

ඉතාම ශිෂ්ට පුද්ගලයාට දේශානුරාගය ආචාර
ධර්මයක් ලෙස කිසිම විමසීමකින් හෝ ප්‍රශ්න කිරීමකින්
තොරව පිළිගැනීමට නො හැකි ය. ඇත්ත වශයෙන්ම
ශිෂ්ට මනුෂ්‍යයා ජාතිවාදී-කට්ටිවාදී සිතුම්-පැතුම් ඇති
කර ගැනීමට ඇති ඉඩ-කඩ ගැන සිතන්නට පෙළඹෙන්නේ
ඉතා අඩු වශයෙනි.

මා ගල්කිස්සේ පදිංචිව සිටිද්දී, බාල වියේ සිටම හොඳින් දන්නා හඳුනන මගේ මිත්‍රයකු වූ අරිල් සමරසිංහ, පැරිසියේ තැන් කීපයක් නැරඹීම පිණිස ඔහු ගේ මෝටෝ රියෙන් මා ගෙන ගියේ ය. පැරිස් සිරි නැරඹීමෙන් පසු සේන් නදී තීරයෙහි වූ පොත් කඩ කරා අපව යොමු කළ පාලමකින් එගොඩ වීමු.

වෝල්ටෙයාර්ගෙන් පසුව, ප්‍රංශයේ විසූ ශ්‍රේෂ්ඨතම උපහාස කතා කරුවා වන ඇනටෝල් ප්‍රාන්ස් මගේ සිහියට එක් වරම නැඟිණ. මා තිස් වන වියේ සිටිය දී කියවන ලද, මේ පොත් කඩ පිළිබඳව ඔහු ගේ රචනයන් හා THE CRIME OF SYLVESTRE BONNARD නමැති නවකථාවෙහි සඳහන් සමහර කරුණු ද යන්තමින් මට මතක් විය.

සේන් ගං තෙර පළල් ගල් කණ්ඩියේ පිහිටා තිබූ පොත් කඩ මගේ සිතෙහි ආනන්දයක් ඇති කළේ ය. සේන් පොත්කඩ කෙරෙහි මගේ සිත වඩාත් ඇදී ගියේ, ප්‍රසිද්ධ ප්‍රංශ ගත්කරුවන් ඒ ගැන නිතරම සඳහන් කිරීම හා ඒ ගැන ලිවීම නිසාම නොව, එම පොත් කඩ-බෙලෙක් පෙට්ටිවල පොත් බහා, ඒ පෙට්ටි හිසින් හෝ කරින් ගෙන පොත් වෙළඳාමේ ගිය අප රට වෙළෙන්දන් ද සිහි කර වූ බැවිනි.

සෑම ඉරිදා පොළකට ම මේ පෙට්ටි ගෙන ගිය ඔව්හු, දිග හරින ලද කුඩයක ඇතුළු පැත්තේ ප්‍රදර්ශනය කරමින් මේ පොත් විකුණූහ. ඔවුන් වැඩියක් ම වෙළඳාම් කළේ ජන කවියට හා ජන කතාවට නඟන ලද ජාතක කතා ආදී මිළ අඩු පොත් ය. පසුව වෙනස් වන සමාජය සමග ඉදිරියට යාමේ දී, මේ සංචාරක පොත් වෙළෙන්දෝ පියදාස සිරිසේන ගේ කතා හා 'කොළඹ යුගයේ කවීන්' වශයෙන් හඳුන්වන ලද කවීන් ගේ ශෘංගාරාත්මක කවි කතා ද විකුණූ හ.

ජන නවකථා කරුවෙක් වූ පියදාස සිරිසේන පිළිවෙළට කතා කීමෙන්, සිංහල ජන කතා කරුවන් ගේ පරපුරේම කතා කාරයෙක් විය. බටහිර වෙස් ගත් සිංහල මිනිසුන් හා ගැහැණුන් ද කච්චේරි මුදලිවරු හා පෙරකදෝරුවෝ ද මේ ජන කාව්‍යවලින් හා කතාවලින් උපහාසයට ලක් කරනු ලැබූ හ. පියදාස සිරිසේන ඔහු ගේ කතාවලින් කච්චේරි මුදලිවරු හා සිවිල් සේවකයන් ද ඇතුළුව, බටහිර වෙස් ගත් සිංහල ගැහැණුන් හා පිරිමින් ඉතා නිර්දය ලෙසත්, සමහර විට ඉතා කෝපයෙනුත් උපහාසයට ලක් කළේ ය. ව්‍යාජත්වයෙන් බිඳක් හා දේශානුරාගය ද ඔහු තුළට පිවිසීම නිසා ඔහු ගේ නව ජන කතාවලට පිවිසි උපහාසය කර්කශ විය.

සේන් නදී ඉවුර බඩ පළල් කණ්ඩියේ වූ පොත් කඩ වසන වේලාව ළං වූ විට, පොත් කඩ හිමියෝ පියන් පත ඔසවා, හඩ නගන සේ තම වැහි කබාය ඒ තුළ දමා, එය වසා, ඉබි යතුරු දමා යති.

ඉයන් නෙයාන් විසින් ලියන ලද ' NAIRN'S PARIS ' පොතෙහි ලා මේ පොත් කඩ හැඳින් වෙන්නේ නිර්නාමික වෙළඳ පලක් ලෙසිනි.

අහස වළාකුලෙන් බරවන්ට වූ නිසා මගේ මිත්‍ර සමරසිංහට මා ඉක්මණින් ' LATIN QUARTER ' පෙදෙසට ගෙන යාමට උවමනා විය. එනිසා මේ අපූරු පොත් කඩ පිළිබඳ කරුණු සොයා ගැනීමට තරම් කාලයක් මට නො ලැබිණ; එහෙත් පසු දින පැරිසියේ ලංකා තානාපති කාර්යාලයේ සේවය කරණ තරුණ සිංහල ගත්කරුවකු වූ ජේ.ඒ. වැන්දබෝනා සමග ගොස් මේ අපූරු පොත් කඩ පිළිබඳව තවත් විස්තර දැන ගතිමි.

ඇනටෝල් ප්‍රාන්ස් පවසන පරිදි, මුලින් මේ පොත් කඩවල බෙහෙවින් තිබුණේ පරණ පොත් ය. දැන් නම් සමහර පොත් කඩවල අළුත් පොත් ද දැකිය හැකි ය.

පොත් කඩ දෙකක උසස් ප්‍රංශ නවකථා කීපයක් ද, නොබෙල් තෑග්ග දිනූ ලේඛක යන් ගේ රචනා ද, අන්‍ය රටවල උගතුන් 'අසභ්‍ය සාහිත්‍ය කෘති' ලෙස හංවඩු ගැසූ හා නීතියෙන් තහනම් කරනු ලැබූ නවකථා ද විය. මුදල් සැපයීමේ අදහසින් ලිංගික කරුණු උපයෝගී කොට නො ගන්නා ප්‍රංශ ජනතාවට, ලිංගික ජීවිතයේ අසභ්‍ය යැයි කිව යුතු දෙයක් නැත.

ඇමරිකාවේ තෝමස් මේලර් විසින් ලියන ලද ඉංගිරිසි නව කතාවක් සහ ප්‍රන්කු හයක් ගෙවා 'ගැරට්' -( GARRET ) සිත්තරකු ගේ සිතුවමක් ද එක පොත් කඩයකින්, මම මිළ දී ගත්තෙමි.

ඇනටෝල් ප්‍රාන්ස් තමා ගේ එක් රචනයක දී, අයි.එම්.ආර්.ඒ.ඊරියගොල්ල මහතා විසින් සිංහලයට පරිවර්තනය කරන ලද 'ද ලා මිසරාබ්ලේ' නවකථාව ලියූ වික්ටර් හියුගෝ විවේචනය කරනු පිණිස, පරණ පොත් කඩ කාරයකු ගේ චරිතය උපයෝගී කොට ගනී. එම රචනයෙහි මාතෘකාව ' ON THE QUAIS MALAGNAIS : M. ALEXANDER DUMAS AND HIS ADDRESS ' යන්න යි.

ඇනටෝල් ප්‍රාන්ස් මෙසේ පවසයි;

"ප්‍රීතියත්, ශෝකයත් මුසු හැඟීමෙන් තොරව, මෙකී ගං තීරය පසු කර යාම මට කිසි කලෙක කළ නො හැකි ය."

එසේ වන්නේ මා උපන්නේත්, මගේ බාල කාලය ගෙවුණේත් මේ ගං තීරයේ නිසා ය. කලක් මට මෙහි දී මුණ ගැසුණ ඒ සුපුරුදු මුහුණු දැන් සදහටම අතුරුදහන් වී ඇත. සිතන දේ පමණක් කීමේ පුරුද්ද නිසාම, මම-මට අරුචි දේ වුවද ඔබට කියමි... මම මෙම ගං තීරයේ පොත්-පත් අතර වාම් දිවි පෙවෙතක් ගෙවූ නිහතමානී මිනිසුන් විසින් හදා-වඩා ගනු ලැබුවෙක්මි.

ඔවුන් පිළිබඳ මතකය රැඳී ඇති එකම පුද්ගලයා ද මම වෙමි...

මගේ බාල කාලය පිළිබඳ දෙස් දෙන මේ පැරැන්නන්ගෙන් එක් අයෙක් පමණක්, මේ ගං තෙර ඉතා දිළින්දකු ලෙස තවමත් ජීවත් වෙයි.

ඔහු, එහි සිටියවුන් අතුරෙන් ඉතාම කුළුපග වූත්, බෙහෙවින් දයාබර වූත් පුද්ගලයන්ගෙන් කෙනෙක් නොවේ! එසේද වුවත්, ඔහු දැකීම මට හැම විටම ප්‍රීතියකි.

ඔහු වෙනෙකෙක් නොව ස්වකීය පොත් පෙට්ටි ඉදිරියෙහි දිදුලන වසන්ත හිරු එළියෙන් උණුසුම් වන දිළිඳු පරණ පොත් වෙළෙන්දා ය. ඔහු තමා ගේ පොත් විකුණන්නේ නැත; ඒවා කියවයි.

ඔහු කලාකරුවෙකි; එමෙන් ම දාර්ශනිකයෙකි.

තොටු පළේ වූ පොත් කඩවලින් වරින්-වර තමාට පොත් ගොඩවල් ගෙනැවිත් දුන් පණිවිඩකරුවකු ගැන ප්‍රාන්ස්, ඔහු ගේ තවත් රචනයක් වූ " UNDER THE ARCADES OF THE ODEAN " නමැති නිබන්ධයෙහි සඳහන් කරයි.

"සත්තකින් ම, මා හිසින් පුරවා ගත් දැනුමට වඩා දැනුමක්, ඔහු කරින් ගෙන ගියේය" යි ඔහු එහිලා සරදම් මුවින් පවසයි.

පැරිසියේ ඉතාමත් කුතුහලය දනවන ආයතනයක් වන මේ පොත් කඩ පිළිබඳව ඇනටෝල් ප්‍රාන්ස් ගේ වාර්තා හා නිබන්ධ සළිත් කියවූ මම, ලංකාවට පැමිණි පසු පැරිසියේ වූ මගේ මිතුරකුට කුහුල දනවන මේ පොත් කඩවල ඉතිහාසය පිළිබඳව ලියැවුණු පොතක් හෝ සඟරාවක් හෝ එවන මෙන් ලියා යැව්වෙමි.

ලුයි ලෙනසල් විසින් අලංකාර අත් අකුරින් සිය අත්සන තබන ලද, පිටු තුන්සියය ඉක්ම වූ " LES BOUQUINISTES DES QUAIS DE PARIS " නමැති පොත තැපෑලෙන් ලැබීම, මගේ අමන්දානන්දයට හේතු විය. ලුයි ලෙනසල්, 1956 දී ප්‍රකාශිත එම ග්‍රන්ථයේ කතුවරයා මෙන්ම, සේන් නදී ඉවුරේ පොත් කඩ හිමියෙක් ද වෙයි.

එම කතුවරයා විසින් මට එම පොත එවන ලද්දේ මගේ මිතුරකු වූ ඩැනියෙල් ෂුරින් විසින් කරන ලද යෝජනාවක් අනුව ය.

ප්‍රංශ බස පිළිබඳ මගේ දැනුම, එහි හෝඩිය ඉගෙන, හරිහැටි වචන උච්චාරණය ඉගෙන නොගෙන, වචන කිහිපයක් අවුලා ගත් එකෙකු ගේ දැනුමට සම කළ හැකි වුවද, ඉවෙන් මෙන් එහි හැඳින්වීමෙහි හා පරි කථාවෙහි සමහර ජේද ඉරි ගසා සටහන් කෙළෙමි. මේ ජේදවලින් කිහිපයක් ප්‍රංශ බස උගත්තා මගේ මිතුරෙක් මට පරිවර්තනය කොට දුන්නේය.

ඩැනියෙල් හැලිවි විසින්, ලූයි ලෙනසල් ගේ කෘතියට ලියන ලද පෙර වදනෙන් පරිවර්තනය කර ගත් ජේදයක් මෙහි දක්වමි ;

"බැල්සක් මේ පොත් කඩ ගැන ලියූ පුරෝගාමියෙකි. අවුරුදු ගණනාවකට පසු මේ සේන් නදී තීරයේ, පොත් කඩ පිළිබඳ සාහිත්‍යය හා එහි කාව්‍යමය සෞන්දර්‍ය නිර්මාණය කෙළේ ඇනටෝල් ප්‍රාන්ස් ය.

ඒ සාහිත්‍යික වර්ණනා ඔහු ගේ නිබන්ධවලත්, පොත් වලත් ඇත. ඔහු පොත් හා ඒ පොත් විකුණන පෙදෙස් ද ඇසුරෙන් පහළ වූවෙකි.

ඔහු ගේ පියා සේන් ගඟ බඩ පොත් කඩ කාරයෙක් නො වුවද, වෝල්ටෙයා තොටෙහි පොත් සාප්පු හිමියෙක් විය.

ඇනටෝල් ප්‍රාන්ස් ගේ ළමා කාලයෙහි පසු බිම් පරිසරය වූයේ ගස්, පොත්, නදී දිය ආදිය යි. ඔහුගෙන් පසු නදී තීරයේ පොත් කඩ පිළිබඳ කරුණු අවුස්සන සියල්ලෝම ඔහු ගේ ගෝලයෝ ය.

ඒ වග දන්නවුන් මෙන් නොදන්නවුන් ද, ඔවුන් අතර සිටිය හැකි ය. ප්‍රන්ස ලේඛකයින් ට වඩා විදේශීය ලේඛකයෝ නදී තීරයේ බිම් පෙදෙසට ඇල්ම කරන්නෝ ය. ඊට සම වන්නක් ලෝකයේ අන් කිසි නගරයක නැති බැවිනි!"

---

පරිවර්තනය : වසන්ත ජයසූරිය

සහ

පියසේන වික්‍රමගේ

---

1977 මහජන පුස්තකාල සංවර්ධන වැඩපිළිවෙල යටතේ
තෝරාගත් මහජන පුස්තකාල ලේඛනය.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් වාර්ෂිකව සංවර්ධනය කිරීම සඳහා තෝරා ගන්නා ලද මහජන පුස්තකාල ලේඛනය මෙහි පහත පළවේ. මේ යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් පාලනය වන මහජන පුස්තකාල 27 ක් තෝරා ගෙන ඇති අතර, මෙම පුස්තකාල පලාත් පාලන කොමසාරිස්වරයා විසින් පුස්තකාල මණ්ඩලයේද අදහස් විමසමින් නිර්දේශ කරන ලද ඒවාය.

මෙයින් මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්ට අයත් මහජන පුස්තකාල, පුස්තකාල මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් සංවර්ධනය කිරීමට කටයුතු යොදා ඇති අතර, හලාවත/පුත්තලම්, හම්බන්තොට, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ (උතුර) යන දිස්ත්‍රික්කවල මහජන පුස්තකාල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මගින් සංවර්ධනය කෙරෙනු ඇත.

| දිස්ත්‍රික්කය | ඡන්ද කොට්ඨාශය | පළාත් පාලන ආයතනයේ නම |
|---|---|---|
| මාතලේ | 1. දඹුල්ල | දඹුල්ල සුළු නගර සභාව |
| | 2. ලග්ගල | වගපණහ උඩසිය පත්තු ගම්සභාව |
| | 3. මාතලේ | අස්ගිරි උඩසියපත්තු ගම්සභාව |
| | 4. රත්තොට | මාතලේ පල්ලේසියපත්තු (නැගෙනහිර) ගම්සභාව |
| නුවරඑළිය | 5. වලපනේ | යටිපළාත ගම්සභාව |
| | 6. හඟුරන්කෙත | දියතිලක ගම්සභාව |
| | 7. කොත්මලේ | පල්ලේපනේ ගම්සභාව |
| | 8. නුවරඑළිය | කඳපොල ගම්සභාව |
| හලාවත/පුත්තලම | 9. පුත්තලම | කල්පිටිය සුළු නගර සභාව |
| | 10. හලාවත | මාදම්පේ සුළු නගර සභාව |
| | 11. නාත්තන්ඩිය | නාත්තන්ඩිය සුළු නගර සභාව |
| | 12. වෙන්නප්පුව | වෙන්නප්පුව සුළු නගර සභාව |
| හම්බන්තොට | 13. බෙලිඅත්ත | තංගල්ල නගර සභාව |
| | 14. මුල්කිරිගල | වලස්මුල්ල සුළු නගර සභාව |
| | 15. තිස්සමහාරාමය | අම්බලන්තොට සුළු නගර සභාව |
| කොළඹ (උතුර) | 16. වත්තල | හැඳල සුළු නගර සභාව |
| | 17. මීගමුව | මීගමුව මහ නගර සභාව |
| | 18. කටාන | කටාන ගම්සභාව |
| | 19. දිවුලපිටිය | කෙහෙල්ඇල්ල ගම්සභාව |
| | 20. මීරිගම | මීරිගම සුළු නගර සභාව |

14වන .....පිටුවෙන්

| | | |
|---|---|---|
| කොළඹ උතුර | 21. මීනුවන්ගොඩ | මීනුවන්ගොඩ ගම්සභාව |
| | 22. අත්තනගල්ල | වේයන්ගොඩ සුළු නගර සභාව |
| | 23. ගම්පහ | ගම්පහ නගර සභාව |
| | 24. ජා-ඇල | ජා-ඇල නගර සභාව |
| | 25. මහර | නාරත්වල ගම් සභාව |
| | 26. දොම්පෙ | පූගොඩ ගම්සභාව |
| | 27. කැළණිය | අළුගම සුළු නගර සභාව |

1977 පාසල් පුස්තකාල සංවර්ධන වැඩපිළිවෙල යටතේ තෝරාගත් පාසල් පුස්තකාල ලේඛනය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් වාර්ෂිකව සංවර්ධනය කිරීම සඳහා තෝරා ගන්නා ලද පාසල් පුස්තකාල ලේඛනය මෙහි පහත පළවේ. මේ යටතේ අධ්‍යාපන අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පාලනය වන පාසල් පුස්තකාල 31 ක් තෝරා ගෙන ඇතිඅතර, ඒවා නිර්දේශ කර ඇත්තේ පුස්තකාල මණ්ඩලයේද අදහස් විමසමිනි.

මෙයින් මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි පිහිටි පාසල් පුස්තකාල පුස්තකාල මණ්ඩලයේ මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මගින් සංවර්ධනය කරනු ලබන අතර, හලාවත-පුත්තලම, හම්බන්-තොට, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ උතුර යන දිස්ත්‍රික්කයන්හි පාසල් පුස්තකාල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මගින් සංවර්ධනය කරනු ලැබේ.

| දිස්ත්‍රික්කය | ඡන්ද කොට්ඨාශය | පාසල හා ලිපිනය |
|---|---|---|
| මාතලේ | 1. දඹුල්ල | වීරකැප්පෙටිපොළ ම.ම.වි. පල්ලෙපොල |
| | 2. ලග්ගල | නාලන්දා ම.වි. නාඋල |
| | 3. මාතලේ | සාන්ත තෝමස් ම.වි. මාතලේ |
| | 4. රත්තොට | කයිකාවල ම.වි. කයිකාවල. |
| නුවරඑ-ළිය | 5. වලපනේ | ශ්‍රී සුමංගල ම.වි. නිල්දණ්ඩාහින්න |
| | 6. කොත්මලේ | හැඳුනාව ම.ම.වි. හැඳුනාව |
| | 7. නුවරඑළිය | ගාමිණී ම.වි. නුවරඑළිය |
| | 8. මස්කෙළිය | ගිණිගත්හේන ම.ම.වි. |
| | 9. ඌව පරණගම | මැදවල ම.වි. |
| | 10. වැලිමඩ | වැලිමඩ ම.ම.වි. |
| මහනුවර | 11. හඟුරන්කෙත | හඟුරන්කෙත ම.වි. (අතිරේක) |

15 වන පිටුවෙන්

| | | |
|---|---|---|
| හලාවත-පුත්තලම | 12. පුත්තලම | තම්බපත්ති ම.වි. තබ්බෝවල පුත්තලම |
| | 13. හලාවත | මාදම්පේ ම.ම.වි. මාදම්පේ |
| | 14. නාත්තන්ඩිය | ධම්මිස්සර ම.වි. නාත්තන්ඩිය |
| | 15. වෙන්නප්පුව | ජෝසප්වාස් ම.වි. වෙන්නප්පුව |
| හම්බන්තොට | 16. බෙලිඅත්ත | විතාරන්දෙණිය ම.වි. |
| | 17. තිස්සමහාරාමය | හුංගම විජයබා ම.වි. |
| | 18. මුල්කිරිගල | මිද්දෙණිය ම.වි. |
| කොළඹ (උතුර) | 19. වත්තල | ධර්මාලෝක ම.වි. කැළණිය. |
| | 20. මීගමුව | හරිශ්චන්ද්‍ර ම.වි. මීගමුව |
| | 21. කටාන | සීදුව දවිසමර ම.වි. |
| | 22. දිවුලපිටිය | දිවුලපිටිය ම.වි. |
| | 23. මීරිගම | මීරිගම ම.වි. |
| | 24. අත්තනගල්ල | බණ්ඩාරනායක ම.ම.වි. වේයන්ගොඩ |
| | 25. ගම්පහ | රත්නාවලී බාලිකා ම.වි. ගම්පහ |
| | 26. ජා-ඇල | ක්‍රිස්තුරාජ ම.වි. කුඩැල්ල. |
| | 27. මහර | හේනේගම ම.මී.වි. |
| | 28. දොම්පෙ | මල්වාන ම.වි. |
| | 29. කැළණිය | සපුගස්කන්ද ම.වි. මාකොළ |
| | 30. මීගමුව(දෙමළ/අතිරේක) | අල්-මුබාරාක් ම.වි. මල්වාන |
| | 31. මිනුවන්ගොඩ | උඩුගම්පොල ම.වි. |

මින් මහජන පුස්තකාල සඳහා මූලිකව රුපියල් දහසක් වටිනා පොත් හා උපකරණ කට්ටලයක්ද, පාසල් පුස්තකාල සඳහා රුපියල් දහසක් වටිනා පොත් කට්ටලයක් පමණක්ද මණ්ඩලය මගින් ප්‍රදානය කෙරේ. ඊට අමතරව පුස්තකාලයේ නුපුහුණු පුස්තකාල සේවකයි සේවාස්ථ පුහුණු පාඨමාලා වලට සහභාගි කර පුහුණු කිරීම සිදුකෙරේ. පුස්තකාලය මනාව සංවිධානය කිරීම සඳහා අවශ්‍ය වන වෘත්තීය මාර්ගෝපදේශය, උපකරණ සාදා ගැනීම සඳහා ආදර්ශ ප්‍රමිතීන් සහිත උපකරණ සහන මිලකට සැපයීමද මේ යටතේ සිදුකෙරේ. දැනට මණ්ඩලය මගින් ආදර්ශ සූචිපත්‍ර කැබිනට්ටු මේ යටතේ සපයනු ලබයි. උපකරණ සැලසුම් පත්‍රිකා, පුස්තකාල අරමුදල් සඳහා ත්‍යාගශීලීන් පෙළඹවීම සඳහා බදු සහන විස්තර පත්‍රිකා ආදියද තව දුරටත් මණ්ඩලයෙන් ලබා ගත හැකිය.

---

Education ... has produced a vast population able to read but unable to distinguish what is worth reading.

-G.M.Trevelyan (1876-1961)

---

## ශ්‍රී ලංකාවේ ජනගහණය හා පුස්තකාල පිළිබඳ සංගණනයක්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් දිවයිනේ දිස්ත්‍රික්කවල ජනගහණය ප්‍රමාණය අනුව ඇති මහජන පුස්තකාල සංඛ්‍යාව ගණන් බැලීමේ ප්‍රයත්නයක් දරා ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 1971 සංඛ්‍යාලේඛන අනුව කර ඇති මෙම සංගණනය සඳහා දැනට දිවයිනේ පිහිටා ඇති සෑම මහජන පුස්තකාලයකම සේවාව ලබන සෑම තරාතිරමකම ජනගහණ ප්‍රමාණය මේ අනුව ගණන් ගෙන ඇත්තේය. මණ්ඩලීය පත්‍රිකාවක් වශයෙන් පිළියෙල කර ඇති එම ලේඛනයේ විස්තර සංඛ්‍යා මෙසේය:

| ප්‍රදේශය | දිස්ත්‍රික්කය | 1971 සඳහන් ජනගහණය | පුස්තකාල සංඛ්‍යාව (1977) | එක් පුස්තකාලයක් සඳහා ජනගහණ ප්‍රමාණය |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | 2,672,520 | 57 | 46,886 |
| | කළුතර | 731,780 | 20 | 36,589 |
| දකුණු පළාත | ගාල්ල | 737,410 | 36 | 20,484 |
| | මාතර | 588,220 | 16 | 36,764 |
| | හම්බන්තොට | 340,990 | 16 | 21,312 |
| මධ්‍යම පළාත | මහනුවර | 1,010,780 | 46 | 21,973 |
| | මාතලේ | 316,330 | 25 | 12,653 |
| | නුවරඑළිය | 629,550 | 17 | 37,032 |
| වයඹ පළාත | කුරුණෑගල | 1,028,050 | 54 | 19,038 |
| | හලාවත/පුත්තලම | 379,770 | 23 | 16,512 |
| සබරගමු පළාත | රත්නපුර | 673,080 | 24 | 28,045 |
| | කෑගල්ල | 640,650 | 25 | 25,626 |
| ඌව පළාත | බදුල්ල | 616,300 | 21 | 29,348 |
| | මොණරාගල | 174,060 | 13 | 13,389 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 389,180 | 33 | 11,793 |
| | පොළොන්නරුව | 163,840 | 09 | 18,204 |
| | මන්නාරම | 72,610 | 10 | 7,261 |
| | වවුනියාව | 105,740 | 18 | 5,874 |
| නැගෙනහිර පළාත | මඩකලපුව | 258,100 | 19 | 13,584 |
| | ත්‍රිකුණාමලය | 191,990 | 18 | 10,666 |
| | අම්පාර | 290,230 | 21 | 13,820 |
| උතුර පළාත | යාපනය | 699,410 | 31 | 22,562 |

එප්පාවල කෝරලේ පුස්තකාලයට *
රු. පන්දහසක් වටිනා පොත්

එප්පාවල කෝරලේ ගම්සභාවේ අක්‍රියව තිබූ මහජන පුස්තකාලයට ගම්සභා පොදු අර මුදලින් රු. පන්දහසක් පමණ මුදලක් වැය කර වටිනා වැදගත් පොත් රාශියක් මිලදී ගෙන , එය යථා තත්ත්වයට පත් කර ගැනීම පසුගිය පෙබරවාරි මසදී සිදු කරන්නට යෙදුන බව වාර්තා වේ.

තඹුත්තේගම පුස්තකාලයට *
රු. දොළොස්දහසක් වටිනා පොත්

තඹුත්තේගම ගම්සභාව විසින් පවත්වාගෙන ගිය කුඩා මහජන පුස්තකාලයට ගම්සභා පොදු අරමුදලින් රු. දොළොස්දහසක් වැය කර, අලුත් පොත් තොගයක් මිලදී ගෙන එය ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇත.

පලාත් පාලන නියෝජ්‍ය ඇමති ඇල්. බී. ජයසේන මහතා විසින් පසුගිය අප්‍රේල් මස 9 වන දින මෙම පුස්තකාලය විවෘත කරන්නට යෙදී ඇත.

එය විවෘත කිරීමේ උළෙලේදී ප්‍රදේශවාසීන් විසින්ද රුපියල් දහසක් පමණ වටිනා පොත් පරිත්‍යාග කරන්නට යෙදුනු බවද වාර්තා වෙයි.

* මෙම ලකුණින් දක්වා ඇති. පුවත් අනුරාධපුර ප්‍රාදේශීය පලාත් පාලන සහකාර කොමසාරිස්වර යාගේ අනුග්‍රහයෙනි.

විජයපුර ගම්සභාවේ ළමා පුස්තකාලය
විවෘත කරයි. *

පසුගිය මාර්තු මස 28 වන දින විජයපුර ගම්සභා නව ගොඩනැගිල්ල විවෘත කිරීමත් සමඟම එහි ළමා පුස්තකාලයක් ද විවෘත කරන ලදි.

පලාත් පාලන කොමසාරිස් ෂර්ලි ද අල්විස් මහතා විසින් මෙය විවෘත කරන් නට යෙදී ඇත.

මන්නාරම් සුළු නගර සභාවෙන්
කියවීම් ශාලාවක්

මන්නාරම් සුළු නගර සභාවට අයත් පල්ලිමුනායි කොට්ඨාශයේ චිකිත්සාගාරය පිහිටි ගොඩනැගිල්ලේම කොටසක සුළු නගර සභාව මගින් කියවීම් ශාලාවක් පිහිටුවා ඇත.
-(සිලෝන් ඩේලි මිරර් 77.05.24)

දැදිගම ගම්සභා පුස්තකාලයට
රජයෙන් රු. එකොළොස්දහසක්

දැදිගම ගම්සභා මහජන පුස්තකාලය සඳහා රු. 11,000/=ක මුදලක් රජයෙන් වෙන් කර දී තිබේ.

ලී බඩු උපකරණ, පොත්පත් සඳහා රු. 5,000/=ක පමණ මුදලක් ගම්සභාවෙන් වැයකර පුස්තකාලයාධිපතිවරයෙක්ද පත් කර ඇත.
-(දිනමිණ : 77.06.06)

## ස්විට්සර්ලන්ත පර්යේෂකයාගෙන් සිංහල සංගීත කෝෂ ග්‍රන්ථයක්

ස්විට්සර්ලන්ත ජාතික සංගීත පර්යේෂකයෙක් වන ආචාර්ය වුල්ෆ්ගෑන් ලාඩේ මහතා සිංහල ජන සංගීතයට කෝෂ ග්‍රන්ථයක් සැපයීම සඳහා තොබෝදා ශ්‍රී ලංකාවට පැමිණ මෙරට පාරම්පරික ශිල්පීන් සහ සංගීත පර්යේෂකයන් හමු විය. විදේශිකයකු අතින් සිංහල ජන සංගීතයට පිරිනැමෙන ප්‍රථම උපහාරය වන මෙය සකස් කිරීමට ආචාර්ය ලාඩේ මහතාට ප්‍රධාන වශයෙන් මූලාශ්‍රය වී ඇත්තේ ගුවන් විදුලි සංස්ථාවේ පර්යේෂණ අංශය විසින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිකුත් කරන ලද Meter Melody and Rhythm in Sinhala Music නමැති කෘතියයි.

දිවයිනේ සුප්‍රසිද්ධ සංගීත ශාස්ත්‍ර විශාරදයින්ගේද, පර්යේෂකයින්ගේද සහාය ලබා ගැනීමටත් අදාල පොතපත හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු ලබා ගැනීමටත් ආචාර්ය ලාඩේ මහතා බලාපොරොත්තු වේ.

## ශ්‍රී ලංකාවේ සිනමා සාහිත්‍යය පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක්

ප්‍රථම සිංහල වෘත්තාන්ත චිත්‍රපටිය ප්‍රදර්ශනයට පැමිණ 30 වසරක් ගෙවීමේ සංවත්සරය නිමිති කර, සිංහල සිනමාව පිළිබඳ විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලියක් ප්‍රකාශයට පත් කිරීමට පාතදුරමහජන පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් සේවය කරන චිත්‍රපට ලේඛකයකු, සංස්කාරක වරයකු, මෙන්ම විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ උපාධිධාරියකුද වන නෙල්සන් පීරිස් මහතා කටයුතු සම්පාදනය කරමින් සිටී.

සිංහල සිනමාව අරභයා සහ පොදුවේ සිනමාව අරභයා සිංහල සහ දෙමළ භාෂාවලින් පුවත් පත් හා වාර ප්‍රකාශනවල එම විෂයය පිළිබඳ පළව ඇති ශාස්ත්‍රීය ලිපි හා විචාර, ලේඛන පිළිබඳව මෙම ග්‍රන්ථ නාමාවලියේ විස්තරාත්මක මාර්ගදේශකත්වයක් සැපයීමට හැකි වෙතැයි සංස්කාරකවරයා අපේක්‍ෂා කරයි.

මේ සඳහා විශේෂයෙන්ම, සිංහල සිනමා සාහිත්‍යයේ මුල් යුගයේ පළ වූ ලිපි ලේඛන සුරක්‍ෂිත ව රැස් කර ඇති ශාස්ත්‍රාභිලාෂීන් වෙතොත්, ඒ පිළිබඳ තොරතුරු පාතදුර මහජන පුස්තකාලය භාරයේ නෙල්සන් පීරිස් මහතා නමට යවනහොත් කෘතඥ වන බව ඒ මහතා දන්වා සිටී.

## සෞඛ්‍ය පර්යේෂණ ග්‍රන්ථ නාමාවලියක්

ශ්‍රී ලංකාවේ 1850 වර්ෂයෙහි පටන් 1976 දක්වා වූ කාල පරිච්ඡේදය තුල සෞඛ්‍යය හා රෝග පිළිබඳ පර්යේෂණ යන්හි ග්‍රන්ථ නාමාවලියක් දැන් සකස් කිරීම අරඹා ඇත.

ජාතික විද්‍යාව සභාව විසින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අවසරය අනුව එම මණ්ඩලයේ ග්‍රන්ථ නාමාවලි පිළිබඳ සහකාර අධ්‍යක්‍ෂිකා කේ.එස්.ජයකුරු මහත්මිය විසින් සැකසෙන මෙම නාමාවලිය වසර අවසානයට පෙර නිම කිරීමට අපේක්‍ෂිතය.

## ජාතික මහා පුස්තකාලයේ

## මැතිවරණ ප්‍රකාශන එකතුව

ශ්‍රී ලංකා ජනරජය යටතේ 1977 වර්ෂයේදී පැවැත්වෙන ප්‍රථම මහ මැතිවරණය සඳහා මුද්‍රණය කරනු ලබන ඒ ඒ පක්ෂ අපේක්ෂකයන්ගේ ප්‍රකාශන, දැන්වීම් ආදිය අඩංගු සම්පූර්ණ මැතිවරණ ප්‍රකාශන එකතුවක් ශ්‍රී ලංකා ජාතික මහා පුස්තකාලය වෙනුවෙන් එක්රැස් කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් දැන් අරඹා ඇත. මේ රටේ අනාගත පරපුර වෙනුවෙන් එක්රැස් කරනු ලබන මෙම එකතුව, අනාගතයේ විශේෂයෙන් දේශපාලන විද්‍යාව හදාරන ශිෂ්‍යයන්ගේ හා මැතිවරණ කටයුතු විවිධ කෝෂයන්ගෙන් අධ්‍යයනය කරනු ලබන විද්‍යාර්ථීන් සඳහා බෙහෙවින් ඵලදායී කටයුත්තක් වනු ඇත.

පුස්තකාල සේවා මණ්ඩලය විසින් මේ රටේ සංස්කෘතික උරුමය සංරක්ෂණය කරනු රක්ෂා පිහිටුවීම සඳහා දැනට සියළු කටයුතු සැලසුම් කර ඇති ජාතික මහා පුස්තකාලයේ අභිවෘද්ධිය පතන සියළුම ශාසනාභිලාෂීන්, පක්ෂ කාර්යාල සහ ජන්දාපේක්ෂක මහත්ම මහත්මීන් මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා සැමතින්ම ආධාරෝපකාර කරන ලෙස කාරුණාවෙන් ඉල්වා සිටිනු ලැබේ. මේ සඳහා එවනු ලබන සියලු ලිපි ලේඛන ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ වෙත යොමු කරන මෙන් තවදුරටත් දන්වා සිටිනු ලැබේ.

---

### <u>මහජන පුස්තකාල ප්‍රමිති.</u>

සංස්කරණය – ප්‍රකාශනය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

මහජන පුස්තකාල සේවය ක්‍රමවත්ව සංවර්ධනය කිරීමෙහි ලා පිළිපැදිය යුතු උපදෙස් මාලාවකින් සමන්විත මෙම ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාල ව්‍යාපාරය සීඝ්‍රයෙන් දියුණුවන මෙම අවධියේදී පුස්තකාලයාධිපතීන්ට, පුස්තකාල විද්‍යා ශිෂ්‍යයින්ට හා පුස්තකාල අධිකාරීන්ට මග පෙන්වන මහඟු ග්‍රන්ථයකි. මෙහි සඳහන් වන්නේ ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා ලද්දාවූද, දැනට බොහෝ රටවල අනුගමනය කරනු ලබන්නා වූද ප්‍රමිති මාලාවකි.

ලංකාවේ මහජන පුස්තකාල ජාත්‍යන්තර තත්ත්වයට ගොඩනගා ලීමට උපකාරිවීමේ අපේක්ෂාවෙන් ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් මෙම ග්‍රන්ථය සකස් කොට ප්‍රසිද්ධ කරන ලදී.

පිටපත් ලබාගැනීම සඳහා මුදල් ඇණවුම් හෝ චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවන්න.

<u>පිටපතක මිල රු. 4/=</u>

අධ්‍යක්ෂ,
ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
72, බෞද්ධාලෝක මාවත, කොළඹ-4.

දුරකථන අංකය: 82243.

---

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/13

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..................

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*